රළ

විප්ලවයේ නිදහස උදෙසා කලාව!
කලාවේ පරිපූර්ණ නිදහස උදෙසා විප්ලවය!

කලා - සංස්කෘතික අතිරේකය
2022 සැප්තැම්බර්

# වසරේ ජනප්‍රිය කෘතිය



සැප්තැම්බරය සාහිත්‍ය මාසයයි. පොත් එළි දැක්වීම්, පොත් ප්‍රදර්ශන හා සාහිත්‍ය සංවාද වැනි සාහිත්‍ය මාසයේ සුපුරුදු අංගවලින් මෙවර සාහිත්‍ය මාසය තොර විය. ඒ මීට මාස කිහිපයකට කලින් උත්සන්න වූ ආර්ථික අර්බුදය විසින් ඒ සියල්ල පිසදා හැර ඇති බැවිනි.

රුපියලේ අගය සීඝ්‍රයෙන් පහළ වැටීම මත, කඩදාසි ආනයනය සම්පූර්ණයෙන් ඇණහිට ඇති බැවින් මෙවර සාහිත්‍ය මාසයේ සාහිත්‍යයෙන් තොර විය, පොත්වලින් තොර විය. ඒ නිසාම සාහිත්‍ය සංවාද පොත් එළිදැක්වීම් ආදියද නොමැති විය. ආහාර හා තෙල් මිලෙහි සීඝ්‍ර ඉහළ යාම විසින් සාහිත්‍ය කෙරෙහි වන පොදු ජන අවධානයද බිංදුවටම සින්දා සමනු ලැබීය. මෙම ආර්ථික අර්බුදය විසින් උග්‍ර කරන ලද ළමා මන්දපෝෂණයේ අනාගත බලපෑම මේ වනවිටත් ගනන් බලා ඇත. එහෙත්, ආර්ථික අර්බුදය විසින් කෙසඟ කරන ලද සංස්කෘතික ජීවිතයේ අනාගත පල විපාක ගණන් බැලීමට නොහැකි වන තරම්ය.

මේ තත්වය යටතේ සීවට් ජොන්සන් (J. Seward Johnson)ගේ 'බෙස්ට්සෙලර්' (Best Seller ) මූර්තිය මෙවර 'රළ' සඟරාවේ මුල් පිටුව තුළ අප ස්ථානගත කරනුයේ එම කෘතිය පිළිබඳ නව අර්ථකතනයක් ලෙසිනි. පැරණි අර්ථයෙහි සාහිත්‍ය වෙළඳපොළ තුළ වසරේ වැඩියෙන්ම අලෙවි වන කෘති, පාඨක අධ්‍යාත්මය පුබුදු කිරීමේ අර්ථයෙන් විශිෂ්ඨම කෘති නොවන බව අඟවන මෙම මූර්තිය, සාහිත්‍ය වෙළඳපොළ කෙරෙහිවන කර්කශ විවේචනයක් ගැබ්කර ගනී. මෙම මූර්තිය මෙවර 'රළ' කලාපය තුළ අප ස්ථානගත කරනුයේ එයට අමතර සමකාලීන අරුතක්ද සහිතවය. එනම්, ආර්ථික අර්බුදය හමුවේ ශීඝ්‍රයෙන් අවධානය ගිලිහී යන පොදු ජන සංස්කෘතික ජීවිතය පිළිබඳ අරුතක්ද සහිතවය. පාඨකයා සාහිත්‍යයෙන් දුරස්වීම පිළිබඳ කියැවීමක් ලෙසය.